හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

මගේ හොඳ
සිංහල ලිපිය
කියවන එක්තරා
හිතවතකු මගෙන්
ඇසූ ප්‍රශ්නයක් අද ලිපිය ආරම්භයේ දීම සඳහන් කරමි.

'ඇයි මේ ලිපියට හොඳ සිංහල කියලා නම දැමීමේ?' මට දිය හැකි කෙටිම උත්තරය මම දුන්නෙමි.
"බාල බොලඳ සිංහලත් තියන නිසා!

අනතුරු ව තවත් ප්‍රශ්නයකට උත්තර දීමට මට සිදුවිය. එය සංකීර්ණ උත්තරයකි. එනිසා එයට පිළිතුර වෙන ම ලිපියකින් ඉදිරිපත් කරමි.

"බොහෝ ම දෙනා මයිනා - බයිලා - දවුල - පවුර ලියන්නෙ යි / වු එක්ක. ඇයැ හොඳ සිංහල ලිපියෙ ඒ වචන මය්නා - බය්ලා - දව්ල - පව්ර කියලා ලියන්නෙ?' මේ ඒ දෙවන ප්‍රශ්නයක්.

දැන් අපි පසුගිය ලිපියේ වැකි පහ විමසා බලමු. " එක මවෙකුගෙ දරු කැල බැවිනා - යමු යමු වී නොපමා" මෙය (ගැදි) වැකියක් ලෙස ලියන්නේ "එක මවක ගේ දරු කැල (බැවින්) බැවිනා (අපි) පමා නො වී (ජය භූමි කරා) යමු (යමු) යනුවෙනි.

අපේ බසේ පුරුෂ ලිංග නාම පදයකට එක් / අකු ප්‍රත්‍යයන් එක වී මිනිසෙක් / මිනිසකු වැනි පද හැදෙන බවත් අක්/අක ප්‍රත්‍යයන් එක් වී ගැහැනිය-ක් / ගැහැනියක වැනි පද හැදෙන බවත් ඔබට මතක ඇතැයි සිතමි. ඒ අනුව 'පියෙක් පුතකු සනසයි/සිඹ් -
මවක් දුවක සනසයි / සිඹ්" යනු නිවැරදි වැකි ලෙස පිළිගැනේ.

'පියෙක් පුතෙක් සනසයි / සිඹ් -
මවක් දුවක් සනසයි / සිඹ් -
මවෙක් දුවෙක් සනසයි/ සිඹ් -
මවෙක් දුවකු සනසයි/ සිඹ් යනාදි වැකි නිවැරදි ඒවා ලෙස නොපිළිගැනේ.

එහෙත් 'පියා පුතා සනසයි/ සිඹ්යි - මව දුව සනසයි / සිඹ්' යන වැකිවල (සියුම්) උක්තයටත් අනුක්තයටත් එකම ප්‍රත්‍යයන් (ආ - අ) යෙදී ඇත. ඒ අනුව අනාගතයේ දී අනියම්/නියම් - ස්ත්‍රී ලිංග / පුරුෂ ලිංග භේදයක් නොතකා එක් ව ප්‍රත්‍ය යෙදීම මනා යැයි පිළිගත හොත් පියෙක් / මවෙක් - පුතෙක් / දුවෙක් සනසයි / සිඹ් යනු නිවැරදි වැකි විය හැකිය.

"සෝබන චන්ද්‍රා නැඟ එනවා - චන්ද්‍රාවෝ ඔබ සිහි වෙනවා" මෙය දී "සෝබන චන්ද්‍රා (චන්ද්‍රයා) (අහසේ) නැඟ එනවා. (ඒ විට) චන්ද්‍රාවෝ (චන්ද්‍රා-වනි) ඔබ (මට) සිහි වෙනවා" යනුවෙනි වැකියක් ලෙස ගලපා ලියන්නේ. තාලය / විරිත රැකීම සඳහා හෝ 'චන්ද්‍රා' නම ඇති තැනැත්තිය ගැන සිතා හෝ 'චන්ද්‍රා' යන ස්ත්‍රී ලිංග නාම පදය මෙහි යොදා ඇත. තාරකාෘ අ - තාරකාව යන වචනය භාවිතයේ ඇතත් චන්ද්‍රෘ අ - චන්ද්‍රයා, සූර්යෘ අ සූර්යයා යනුවෙන් ව්‍යවහාරයට පැමිණි නැත. ඒවා පුරුෂ ලිංග 'ආ' ප්‍රත්‍යය සමග චන්ද්‍රෘ ආ - චන්ද්‍රයා, සූර්යෘ ආ - සූර්යයා යනුවෙනි භාවිතයට පැමිණි ඇත්තේ.

හිරු, සඳු, කුජ, බුදු, ගුරු, කිවි, සනි, ව්‍යාක්ති ප්‍රත්‍ය එක් නොකොට භාවිතා වන අතර අගහරුවා, සිකුරා, සෙනසුරා (කෙහෙතා) පුරුෂ ලිංග විභක්ති ප්‍රත්‍ය එක් කොට භාවිතා වේ. පඹයා, බෝතික්කා, ඉබ්බා (ඉබ්යතුර) මෙහි. චන්ද්‍රා යන ස්ත්‍රී ලිංග නාම පදය චන්ද්‍රාව, චන්ද්‍රාවෝ, (සිරිමාවෝ මෙනි) චන්ද්‍රා-වන් ආදී වශයෙනි වර නැඟෙන්නේ. එහෙයින් මේ වැකියේ 'චන්ද්‍රාවෝ' යන්න 'චන්ද්‍රාවනි' යනු වෙන් ගත යුතු ය.

'පැමිණිලිකරුවොය් වැරදිකාරයෝ, විත්තිකාරයෝ නිදහස්'
මෙහි වැකි දෙකකි. මුල් වැකියේ උත්ත දෙකකි. ඒවා මාරු කොට
"පැමිණිලිකරුවෝ වැරදි කාරයෝ ය - වැරදිකාරයෝ පැමිනිලිකරුවෝ ය යනුවෙන් ද කිව හැකිය.

'පැමිනිලි කරනවා' යන්න පොලිස් / උසාවි බාසාවට එක් වූයේ කෙසේ ද? කවදාද? යනු මම නොදැනිමිනා දන්නේ පමන (පමණ) 'ධාතුව' පැමිනේ - පැමිනෙනි' ආදි වශයෙනුත්, පැමිනුම - පැමිනීම - පැමිණිල්ල (උම් - ඊ - ම් - ඉලි ප්‍රත්‍ය එක් වී) ආදී වසයෙනුත් වරනැගෙන බවය්. 'රවට' ධාතුවෙන් රැවටිල්ල - රැවටිලිකරුවෝ වැනි වචන හඳුන ගත හැකිය. පමුන ධාතුවෙනුත් පැමිනිල්ල - පැමිනිලිකරුවෝ වැනි වචන හඳා ගත හැකිය. රවටන අය රැවටිලිකරුවෝ ය. පැමිනෙන අය පැමිනිලි කරුවෝ ය. එහෙත් එනි තෙරුම වෙනස් වී වෝදනාවට පැමිනිල්ලත් වෝදකයාට පැමිනිලිකරුවාත් ව්‍යවහාරයට පැමිණ ඇත. විත්ති යනු තොරතුරු ය. ගමේ විත්ති යනු ගමේ තොරතුරු ය. එහෙත් විත්තිකරු යනු වූදිතයා ය. එබඳු වචන 'වෛකල්පිත" ගනයට වැටේ. කිසිම නීතියක් හෝ රීතියක් ඒවාට

එබඳු වචන 'වෛකල්පිත" ගනයට වැටේ. කිසිම නීතියක් හෝ රීතියක් ඒවාට නැත. ඒ ගැන ඇසිය යුත්තේ පලමු වරට ඒ වචන මෙසේ ව්‍යවහාරයට ගත් පුද්ගලයාගෙනි.

නැත. ඒ ගැන ඇසිය යුත්තේ පලමු වරට ඒ වචන මෙසේ ව්‍යවහාරයට ගත් පුද්ගලයාගෙනි. මේ වැකි දෙක ම අපේ වියරන රීතීන්ට අනුව නිවැරදි ය ! පැමිනිලිකරුවෝ වැරදිකාරයෝ ය. විත්තිකාරයෝ නිදහස් ය ! යනුවෙනි එය ලියවෙන්නේ.

අපේ අම්මා මට හරිම ආදරෙය් මාය් ඇගේ එක දරුවා - කසාදයක් මට බඳින්න කියලා හිතර ම කරදර කෙරුවා" මේ විකට ගීයේ කෙරුවා වැනි ග්‍රාම්‍ය වචන යොදා ඇත්තේ විරිත සහ එළිවැටට රැකීම සඳහා ය. "කර' ධාතුව වරනැගෙන්නේ කරා (යි) කරති - කළ - කළ (කළේය - කළෝය) ආදී වශයෙනි. 'මර' ධාතුව මරා (ය්) මරති - මැරි - මැරෑ යනුවෙනුත් 'දර' ධාතුව දරා(ය්) දරති - දැරි - දැරෑ යනුවෙනුත් වහරේ පවතිද්දී කරා(යි) කරති කැරි - කැරෑ නොවූයේ මන්දැය් අපේ අම්මා මට හරිම ආදරේ ය. මා ඇගේ එක (ම) දරුවා ය. (අඳ) මට කසාදයක් බඳින්නැ(ය්) කියා ලා හිතර ම කරදර කෙරුවා (ය.) යනුවෙනි. මෙහි දෙවැනි වැකියේ උක්ත දෙකකි. මා දරුවා ය දෙපදයක උක්ත විය යුතුය. එ නිසා ඒ වැකිය "මම ඇගේ එක ම දරුවා ය / වෙමි' විය යුතුය. මෙබඳු වැකිවල ආඛ්‍යාතය අධ්‍යාහාර්ය - යෙන් ගැනීම සිරිතය් 'අපි දරුවෝ වෙමු - ඔහු දරුවෝ වෙති' ආදි වශයෙනි.
දෙවියෙක් වාගෙ මෙයා ආවා නේ මාව සොයා. කඳිමට උඹට මමත් මම උඹටත් මැව් වෙනවා' මෙය ද විකට ජවනිකාවක සිදුවනකි.
'ගැලපෙනවා' යන තේරුම දීමට මෙහි ඇත්තේ 'මැව් වෙනවා' යන යෙදුමයි. 'Match' (මැව්) යන ඉංගිරිසි වචනය බහ්වර්ථ පදයකි. එය තේරුම් හතක් පමණ දීම සඳහා යෙදේ. ඉන් එකක 'If you match one thing with another, you decide that one thing is suitable for the other' යනුවෙන් සඳහන් වේ. ඒ අනුව 'මැව් වෙනවා' යන්නේ 'ගැලපෙනවා' යන අදහස එසේම ඇත. "විවෘත කරනවා - විනාශ කරනවා - විශ්වාස කරනවා' යන යෙදුම්වල විවෘත, විනාශ, විශ්වාස යනු සංස්කෘත වචනය්. අඩන්තේරීටම් - අඳුස්කු - ආන්ඩු ආදි දෙමල වචනවලට 'කරනවා' යන්න එක් කොට භාවිතා කරන බව ඔබ දනිති. ඒ අනුව 'මැව් වෙනවා. මික්ස් කරනවා - අව්ව් කරනවා' වැනි යෙදුම් ඇසෙන දකින විට මුනිවත රැකීමට අපට සිදු වේ.
මෙයා (මොනු) දෙවියෙක් වාගේ මාව සොයා ආවා නොවද! නුඹට මමත් මම නුඹටත් මැව් වෙනවා' යන දෙ වැකියේ **දෙවියෙක් වගේ යන්න දෙවියකු වාගේ (මෙන්) විය යුතුය.**

ගී සින්දු කවි, ලිවීමේ දී වුවද භාෂා රීති සිඳ බිඳ දැමීමට කිසිවකුට අවසර නැත. භාෂා රීති කඩා බිඳ දැමීම යනු තමන්'ගේ බස් දැනුමේ අඩුව - දුබලකම එළි කිරීමකි.

නුඹට මමත් මම නුඹටත් යනු නුඹට මමත් මට ම නුඹත් නොවේ. එහි දෙවරක් ම කියා ඇත්තේ මම නුඹට මෙන් වෙන බවය්. එසේ ම මම යන උත්ත රූපය එතැනට නොගැලපේ. 'මා නුඹටත් නුඹ මටත් මැව් වේ' යන්න නිවැරදි ය.

ගී සින්දු කවි, ලිවීමේ දී වුවද භාෂා රීති සිඳ බිඳ දැමීමට කිසිවකුට අවසර නැත. භාෂා රීති කඩා බිඳ දැමීම යනු තමන්'ගේ බස් දැනුමේ අඩුව - දුබලකම එළි කිරීමකි. ලඳුන් බිළිඳුන් කිවිඳුන් අතින් වන වැරදි ලුහු කොට හැකිය යුතු බව සමහරු කියති. වහලක් ඇඳ නැති ව තැනීමට බුහුටි - හපන් වඩුවන් සමත් බව කිවමනා ද? එසේ වුව ද වැදගත් - උසස් අදහස් දුඹුල් බසින් වුව ද පැවසීම වැඩවත් ය. ප්‍රයෝජනවත් ය. වෙනත් ක්‍රමයක් නැති විට හඳිසියකදී රජකු වුව ද බූරුවකු පිට යෑම වරදැයි කිව හැකි ද?

දැන් මේ වැකි පහට අවධානය යොමු කරන්න. මෙහි ඇති රූඩි (රූඩ්) ඉගෙන ගන්න.
1. දිවෙන් දිව ගා ගෙන හිටියත් ගැනු ගෑනු මයි.
2. දිනුම් පිලට හෝය්යා කීම ඔහුගේ සිරිතය්.
3. පියදාසයා දිව දෙකේ මිනිහා.
4. ඇයි ඉක් බිම දකින තෙක් අප ඉන්නේ ඇඟලි ගැන ගැන.
5. දැය උන්දලෑ(ය්) පොර කටු ගෙවිලා.

මේ ලිපියේ ණ/ළ යොදා නැත. 'ශ' වෙනුවට 'ස' යොදා ඇත.

ඔබේ හැකියාවෙන් ප්‍රයෝජන ගන්න

'ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත" කියල කියමනක් අිප අඟල තිබුණට අපේ රටේ අයවලුන් දිහා විශේෂයෙන්ම කාන්තාවන් දිහා බලද්දී මං හිතන්නෙ ඔය කියමන වෙනස් වෙන්නෝනි. මොකද එක් දෙයකට හෙවෙයි එකිනෙකට වෙනස් වූ විවිධාකාර හැකියාවන් තියෙන අය අපේ රටේ ඕනි තරම් ඉන්න නිසා.

අපේ රටේ අයවලුන් විවිධ හැකියාවන්ට, කලාත්මක දේවල් නිර්මාණයට හුගාත් දක්ෂයි. නමුත් විවිධ ජාතීන්ගෙන් සැදුම්ලත් මේ රටේ මිනිස්සු හැමදේම මිළට ගන්න පුරුදු වෙලා ඉන්නවා මියෙක මොන වගේ හැකියාවක් තමන් සතුද කියලා දන්නෙවත් නැහැ. මං අදහස් කරන්නේ රැකියාව ගැන නෙවේ. රැකියාවේදී නං ඒ ඒ අංශයට නිපුණත්වයක් තියෙන නිසා කොයියම්ම පැත්තකින් හරි තමන්ගේ දක්ෂතාවය එළි දැක්වෙනවා. ඒත් අපි අපි අතරෙ විනෝදාංශ විදියට තෝරා ගත්තු කොයි තරම් දක්ෂතාවල් තියෙනවාද? මං කතා කරන්නෙ ඒවා ගැන.

සමහරු නං කිසිම දෙයක් කර ගන්න බැහැ කියනෙකත් ලොකුකමක් විදියට කතා කරන අවස්ථාවල් තියෙනවා. ඒත් යම්කිසි නිර්මාණාත්මක හැකියාවක් ඔබට තියෙනවා නම්, ඒක අඩු තරමින් ඔබේ දරුවන්ටවත් කියලා දෙන්න. සාජ්ජවෙන් ගෑණු දරුවෙකුට ඇඳුමක් ගන්නවා වගේම, ඇඳුමක් මඟ ගන්න හැටි දරුවෙකුට කියලා දෙන්න පුළුවනි නං ඒක හුගක් වටිනි.

මා පුංචි උදාහරණයක් කියන්නම්. ලංකාවේ ඉන්න කාලෙදි මගේ ලොකුම විනෝදාංශයක් තමයි සාරි පින්තාරු කිරීම. මගේ සාරි මං පින්තාරු කර ගත්තම මේ ලෝකෙන්ම ඒ ජාතියෙ සාරියක් තිබුණේ මට විතරයි. මෙහෙ ආවම සුදු පාට කුඩයකටත් මං ඒ දේම කළා. විශ්වාස කරනවාද? වැසි දවස්වලට ඒ කුඩය පාවිච්චි කරන වාරයක් වාරයක් පාසා දෙතුන් දෙනෙක් දවසකට අහගනවා ඒ කුඩය ගත්ත සාප්පුවේ නම. එක මගේ පින්තාරුවක් කිව්වම හුගදෙනෙක් මට කියනවා හොඳ ඉල්ලුමක් තියෙනවෙළඳසළක් හදාගන්න විදිය. රැකියා කටයුතුත්තෙක්ක කායෙ බහුල වෙලා ඉන්න මම තාම ඒ ගැන හිතුවෙ නැතිවට පුංචි ආඩම්බ-රයක් හිතට දැනෙනවා කවුරු හරි ඒ ගැන අහය කිරීමක් කරන කොට, හේතුව තමයි ඕස්ට්‍රේලියාවෙ විතරක් නෙවෙයි මුළු ලෝකෙන්ම ඒ ජාතියෙ කුඩයක් තියෙන එකම කෙනා මම නිසා.

හිතන්න... රැකියාවක් හොයා ගන්න බෑ කියලා හරි, රැකියාවක් නෑ කියලා හරි ලත වෙනවාට වඩා ඔබට යම්කිසි හැකියාවක් තියෙනවා නම්, එයට වෙළෙඳ පොලක් හදාගන්නෙක අමාරු නෑ. "කාලය කියන්නෙ මුදලැ" කියන හැඟීමෙන් වැඩ කරන මේ රටේ ආර්ථික වශයෙන් අමතර ශක්තියක් ඔබේ පවුලට ලබාදෙන්න පුළුවන් වෙනකත් ලොකු දෙයක් නේද?

මේනකා ජයතිලක
කව්විත්ස්ලන්තය

සුභාෂිතයෙන් ...

එබැවින් සෙබෙහි වියතිනි ගුන යුත් පහර
කිරියෙන් දියර වෙන් කල හස මෙන් පවර
ම - විසින් කියන මෙහි වරදක් දුටත් පවර
සතොසින් අසව් පදරුත් විමසා ගැඹර

එ බැවින් සෙබෙහි පතර ගුණ යුත් වියතිනි
ම - විසින් කියන මෙහි වරදක් දුටත් ,
කිරියෙන් දියර වෙන් කල
පවර හසමෙන් හැර ගැඹර පඳ අරුත්
විමසා සතොසින් අසව්.

එ බැවින් - එසේ හෙයින්, සෙබෙහි - සබයෙහි, පතා ගුන යුත් වියතිනි. මහත් වූ ගුන ඇති වියතුනි (පන්ඩිතය්නි), ම විසින් කියන - මා විසින් කියනු ලබන (මා කියන), මෙහි වරදක් දුටත් - මේ කව්වල දෝෂයක් දුටුවත්, කිරියෙන් දියර වෙන් කල - කිරෙන් වතුර ඉවත් කල, පවර හසමෙන් - උතුම් හංසයන් සේ, හැර - ඒ (දොස) ගැන නොසිතා (අත්හැර) ගැඹර පඳ අරුත් - ගැඹුරු පඳ අර්ථ විමසා - පරීක්ෂා කොට, සතොසින් අසව් - සන්තෝසයෙන් අසව්.

සෙබෙහි - සබ, එහි - සබයෙහි යනුවෙන් වහරේ එය්. බෙලෙහි බෙලෙන්, සෙමෙහි සෙමෙන් මෙන් සෙබෙහි සෙබෙන් යනු වියත් වහරය්. වියතිනි, දරුවනි මිනිසුනි ලමයිනි (ලමය්නි) යන පදවල අනි උන් ඉන් යන ප්‍රත්‍ය තුන යෙදී ඇති සැටි සිතට ගන්න. වස - වසුර වන විදියට ම දියෘ ර - දියර වේ. ගැඹර - අකුරු / අකර අතුරු / අතර, අඳුරු / අඳර වන විදියට ම ගැඹුරු / ගැඹර වේ. කිරිෘ එන් - කිරියෙන් / කිරෙන් යන දෙ විදියට ම වහරේ එය්.

මැටි / මැටියෙන් තැටි / තැටියෙන්, හැලි / හැලියෙන් යන දෙ විදියට ම පද හදේ. ම - විසින් කියන - ම විසින් කියනු ලබන / මා කියන යනුවෙන් ලියවිනි නම් වඩාත් නිවැරදි ය. මේ කව්වල වැරදි නොසොයන ලෙස කතුවරයා අපෙන් ඉල්ලා සිටි. **වි.ක.**